විධාන අංක : 04

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1) වැනි වගන්තිය යටතේ විධාන

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වැනි වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අංක 1303/1 හා 2003.08.25 දිනැති සහ අංක 1324/18 හා 2004.01.21 දිනැති ගැසට් නිවේදනයන්හි උපලේඛනවල සඳහන් කර ඇති භාණ්ඩයන්හි බර/පරිමාව සහ නිෂ්පාදිත දිනය අදාළ භාණ්ඩයේ හෝ ඇසුරුමේ හෝ බහාලුමේ හෝ දවටනයේ සඳහන් කළ යුතු බවට සියළුම නිෂ්පාදකයින් හා වෙළඳුන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙසේ විධාන කරනු ලැබේ.

මෙම විධානය 2005 සැප්තැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු අධිකාරියේ අණ පරිදි,

වෛද්‍ය එම්. අයි. එම්. මුහුසීන්,
සභාපති.

2005 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දීය.

09-220/2

---

නියෝග අංක :- 05

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වැනි වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සියළු විදුලි සහ/හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ/උපකරණ/උපාංග සඳහා අවම වශයෙන් අදාළ භාණ්ඩ විකුණනු ලබන දින සිට මාස හයකට (06) නොඅඩු කාලයක් බලපැවැත්වෙන පරිදි ප්‍රතිඥාභාරයක් (වගකීමේ කාලයක්) ලබා දිය යුතු බවට අදාළ සියළු විදුලි සහ/හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ/උපකරණ/උපාංග සාදන්නන්/වෙළෙන්දන්/ආනයනකරුවන්/සපයන්නන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙසේ විධාන කරනු ලැබේ.

මෙම විධානය 2005 සැප්තැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

වෛද්‍ය එම්. අයි. එම්. මුහුසීන්,
සභාපති.

2005 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දීය.

09-220/3

විධාන අංක : 06

### 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

### 12(1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින්, දේශීයව සාදනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන අටපිරිකර, ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර SLS 1257 සහ SLS 1258 ට අනුකූල වන්නේ නම් මිස කිසිම නිෂ්පාදකයකු හෝ වෙළෙන්දෙකු විසින් නිපදවීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ගබඩාකර තැබීම නොකළ යුතු යැයි මෙයින් විධාන කරනු ලැබේ. තවද, එම අටපිරිකරට ඇතුළත්වන සෑම අයිතමයකම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය පැහැදිළිව ප්‍රදර්ශනය කළ යුතු යැයි ද මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය 2006 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

වෛද්‍ය එම්. අයි. එම්. මුහුසීන්,
සභාපති.

2005 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දීය.

09-220/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.